# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2008/25 - 2017 මාර්තු මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2017.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 (1) වන වගන්තිය යටතේ නියෝගය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 (1) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙම නියමයෙන් කොළඹ මහ නගර සභා සීමාව තුළ, වනාතමුල්ල කොට්ඨාසයේ දෙමටගොඩ, පිහිටි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති කොළඹ මහ නගර සභාව සතු පහත උපලේකනයෙහි සඳහන් (ගව ඝාතකාගාරය) නැමති ඉඩම, අද දින සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

පාඨලී චම්පික රණවක (පා.ම.),
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 පෙබරවාරි මස 22 වැනි දින,
17 හා 18 වන මහල,
''සුහුරුපාය'' සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ අංක 30 දරන වනාතමුල්ල කොට්ඨාසයේ දෙමටගොඩ, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ පිහිටි රජයේ ඉඩම් අංක 06 දරන සැලැස්මේ කැබලි අංක 01 දරන සැලැස්මේ සඳහන් කර ඇත්තා වූ ද පහත සඳහන් මායිම් ඇතුළත පිහිටි ප්‍රමාණයෙන් අක්කර 6., රූඩ් 01., පර්චස් 29.7ක් වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| උතුරට | - | පුද්ගලික ඉඩම, ඇල |
| නැගෙනහිරට | - | ඇල |
| දකුණට | - | දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම |
| බටහිරට | - | බේස්ලයින් පාර. |

03 - 745

1A - G 25212 — 08 (2017/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*